**IPRC/16/145**

# සිනමාවත 90 දශකයෙන් පසු සිනමාවේ නිරූපිත ජනවර්ගික අර්බුදය (සිනමා අධ්‍යක්ෂකවරුන් දෙදෙනෙක් ඇසුරින්)

ප්‍රභාශ්වර නිශ්ශංක[1*]

1947 දී ඉන්දීය සම්භවයෙන් ඇරඹි ලාංකේය සිනමාව 1956 දී ලාංකේය ප්‍රස්තුත හසුකර ගනිමින් ලාංකේය අනන්‍යතාවක් නිර්මාණය කරගනු ලබන්නේ 1956 රේඛාව සිනමා කෘතියත් සමඟ ය. ඉන්පසු දේශීය තේමා සිය නිර්මාණ ඔස්සේ ප්‍රකාශයට පත් කිරීමට ලාංකේය අධ්‍යක්ෂකවරුන් උත්සාහ දරා ඇත. 1948 පෙබරවාරි 4 දින බ්‍රිතාන්‍යයන්ගෙන් රට දේශීය පාලකයන්ට පැවරීමෙන් අනතුරුව 1971, 1989, 2009, ආදි වසරවල රටෙහි භීෂණ / කැරලි / විප්ලව / සිවිල් යුද්ධ පැවතිණ. මේ සිවිල් අරගල කෙලවර සනිටුහන් වනුයේ බොහෝ මානව ජීවිත ප්‍රමාණයක් විනාශ වීමෙන් ය. මේ අතරින් වසර 30 ක් පුරා පැවති යුද්ධය ප්‍රධාන වේ. මෙම තේමාව කෙරහි කලාකරුවන් අවධානය යොමු කර ඇතත් මානව සන්නිවේදනයේ ප්‍රබල ම අංගයක් වන සිනමාව තුළින් යුද්ධය යන ප්‍රස්තුතය සැලකිය යුතු මට්ටමකින් සාකච්ඡා කර ඇද්ද යන ගැටලුව ඇත .‘යුද්ධය’ ප්‍රස්තුතය මහේශාක්‍යව මෙන්ම ශුද්‍රව ද සිනමා ක්ෂේත්‍රයට ඇතුළු වී ඇත. ලංකාවේ සිවිල් යුද්ධය ආරම්භවීම, අවසන්වීම සහ වසර තිහක කාලයක් තුළ මිනිස් ජීවිත විශාල ප්‍රමාණයක් විනාශ වීම, මානව සංතානයේ සිදු වූ බිඳ වැටීම් යුද්ධයේ දී ආනුභූතික පෙන්නුම් කිරීම් ය. මෙම බේදයන් ශ්‍රී ලාංකේය සංදර්භය තුළ කුඩා දරුවාගේ සිට මහල්ලා දක්වා ගොදුරු කර ගන්නා බව පෙනෙයි. මෙම ආනුභූතිකයන් ලාංකේය කලාකරුවන්හට ගෝචර වූයේ ද? එසේනම් එම ගෝචරවීම ප්‍රකාශිත වීම සිනමාව තුළ කවර වූ ස්වරූපයක් ගත්තේ ද? යන්න හඳුනා ගැනීම මෙම රචනාවේ අභිමතාර්ථයයි. එහි දී පර්යේෂණ පහසුව සඳහා 90 දශකයෙන් පසු බිහි වූ සිනමා නිර්මාණ සහ ප්‍රධාන අධ්‍යක්ෂකවරුන් දෙදෙනෙකු පමණක් පර්යෙෂණයේ අවධානයට පත්කරීමත් ඔවුන්ගේ ප්‍රධාන සිනමා කෘති එක බැගින් සන්සංදනාත්මකව හඳුනාගැනීමට උත්සාහ කරමි. අශෝක හඳගම අධ්‍යක්ෂකගේ ‘මගේ සඳයි’ සිනමා කෘතිය සහ විශ්වනාත් බුද්ධි කර්තිසේන මහතාගේ ‘මාතා’ සිනමා කෘතිය මෙහි දී විමසා බැලීම අරමුණයි. කලාවේ කාර්ය පිළිබඳ විවිධ කතාකාවත් තිබුණ ද කලා නිර්මාණයන්හි සන්දර්භය සකස් වීමේ දී පොදු මහත් බහුතරයක් මුහුණ දී ඇති ගැටලු කෙරෙහි සංවේදනය වීම කලා කරුවකුගේ වගකීමකි. යුද්ධය නැමති තේමාව පිළිබදව දේශීය නිර්මාණකරුවන් කොතරම් දුරට තේමාත්මකව සිය නිර්මාණ ඔස්සේ තම වගකීම ඉටු කෙරුවේ ද? යන්න මෙහිදී අවධානය යොමු කළ යුතු ය. ලංකේය සිනමාවක් ලෙස සිනමාවේ දිශානතියේ එලෙස ගතිකත්වයක් හදුනා ගත්තේද? එම හඳුනා ගැනීම ප්‍රකාශ මානයේ දී දැක්වූ විශේෂතා නව ප්‍රවනතාවක් හෝ අනන්‍යතාවක් ලෙස ලාංකේය සිනමාව නව ශානර හෝ උපශානරයන්ගේ ප්‍රභවයක් සිදු වූයේ ද? යුද ශානර සිනමාව ලෝකය තුළ නව අත්හදා බැලීම් සහ නව සිනමා උප ශානර බොහෝ ප්‍රමාණයක් සදහා පාදක වූ බව යුද සිනමා ඉතිහාසය කියා දෙයි. කාලය හා අවකාශය ජයගැනීම සිනමාවේ ප්‍රබල අභියෝගය යි. සිනමාවට හිමි මව් භාශාමය ගුණය අතින් සිනමාව ලාංකේය භූමිය මත යුද්ධය පැවති වසර තිහක් තුළ ලංකේය සිනමා භාෂාවක් පිළිබඳ හෝ යුද්ධය අවසන් වී වසර කිහිපයක් ගතවී ඇති අද දවස දක්වා සිනමා න්‍යායක් පිළිබදව නිරීක්ෂණයෙන් හඳුනාගත හැකි ද? ඒ සඳහා භාවිතා කර ඇති න්‍යායාත්මක මැදිහත් වීම් සහ සිනමා භාශාමය මැදිහත් වීම් මොනවා ද ? මේ පිළිබඳව සොයා යෑම දේශීය සිනමාවක ගමන් මග සහ දේශීය සිනමා කරුවාගේ ආස්ථානය කෙබදු වී දැයි පරීක්ෂා කිරීමකි. ඹමහි දී ප්‍රධානතම තර්කය ගොනු වනුයේ එවැනි භාෂාත්මක හෝ න්‍යායාත්මක ලක්ෂණයනට දේශීය අනන්‍යතාවක් බිහි වී නැත යන්නයි. එය සනාත කිරීම මෙහි දී මාගේ අභිප්‍රායයි.

***ප්‍රමුඛ පදඃ*** *සිනමාව, ශානරය, උපශානරය, සිනමා භාෂාව, යුද සිනමාව, ලාංකේය සිනමාව*

[1] කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව *prabhashwara6@gmail.com